### පවසන දෙයකට සවන් දී ප්‍රශ්නවලට පිළිතුරු දෙමු

ක්‍රියාකාරකම 01

- පහත දී ඇති ඡේදය වැඩිහිටියෙකුට කියවන්නට දී හොඳින් සවන් දෙන්න

සැම ගෙයක් ම ගෙවත්තකින් යුක්ත ය. අක්කරයක් දෙකක් තරම් විශාල ගෙවත්ත හතර වටේ ම පැළ ඉනි වැටකි. ගේ ඉදිරි පසින් වැටෙන් ඇතුළු වීමට සෑදූ කඩුල්ලකි. ගෙවතු දෙහි, දොඩම් හා මඤ්ඤොක්කා යන වගාවන්ගෙන් යුක්ත ය. කෝං, මාදං, සියඹලා, බුරුත, වෑවරන, මිල්ල වැනි විශාල ගස් එකක් දෙකක් හෝ නැති ඉඩමක් දැකිය නොහැකි ය. මයිල ගසක් හෝ කිහිපයක් සැම ඉඩමක ම වෙයි. කපා බිම හෙළන ලද විශාල ගස්වල කඳන් පිලිස්සී ඉතුරු වූ කොටස් මේ ඉඩම්වල සුලබ ය. . . .හැම ඉඩමක ම ලබු වැලක් දෙකක් අනිවාර්යයෙන් දකින්නට ලැබේ. දිය ගෙන ඒමට ගන්නා භාජනය වශයෙන් හා බීජ සඳහා ගන්නා ධාන්‍ය තැන්පත් කර තැබීමට ලබුකැට භාවිත වේ. මේ නිසා බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයකි.

වනගත චාරිකා, පියසේන කහඳගමගේ.

- ඡේදය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට වාචික පිළිතුරු ලබා දෙන්න.පසුව ලියන්න

1. ගෙවත්ත වටේට ඇත්තේ කුමක් ද ?.......................................................................................

2. ගේ ඉදිරිපස වැටෙන් ඇතුළු වීමට සාදා ඇත්තේ කුමක් ද ?...................................................

3. ගෙවත්තේ ඇති වගාවන් මොනවා ද ?......................................................................................

4. ගෙවත්තේ ඇති විශාල ගස් වර්ග තුනක් පවසන්න.

....................................... ....................................... .......................................

5. බින්තැන්නේ ජන ජීවිතයට ලබු වැල නැතුව ම බැරි දෙයක් වන්නේ ඇයි ?

.......................................................................................................................................

### මාතෘකාවකට අදාළ ව කතා කරමු

ක්‍රියාකාරකම 02

- පහත දී ඇති මාතෘකාවලින් එකක් තෝරා ගෙන කතාවක් පැවැත්වීමට අවශ්‍ය තොරතුරු රැස් කරන්න.ඔබගේ කතාව පවුලේ සාමාජිකයන්ට ඉදිරිපත් කරන්න. එයින් කරුණු පහක් වාක්‍ය ලෙස ලියන්න.
  - මා කැමති ම කතා පොත
  - රූපවාහිනිය
  - වැඩිහිටියන්ට සලකමු
  - මගේ ගෙවත්ත
  - මා ගිය විනෝද ගමනක්